# මෙත් සවිය

## මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

## METH SAVIYA NEWS LETTER

• සාමාජිකයන් සඳහා තොරතුරු පත්‍රිකාව • 2010 සැප්තැම්බර් • මෙත් සවිය අටවන කාණ්ඩය • පහලොස්වන කලාපය



නිතින් මෙත් සිතින් මම් වෙසෙම් වා
ගතින් මෙන් සිතින් රෝ මුදම් වා
බැතින් තුන් රුවන් ඔප් නගම් වා
මෙතින් නෙත් පියම් වා නිවෙම් වා

ශ්‍රී විජයාරාමය, ෆෙඩ්‍රිකා පාර, කොළඹ 06
දු.ක.: 0714 014467 දු.ක./ෆැක්ස් : 011 2505088 වෙබ් අඩවිය : www.methsaviya.org විද්‍යුත් තැපෑල : office@methsaviya.org

# මීළඟ දාන-ශීල-භාවනා වැඩසටහන සහ සදහම් චාරිකාව 2010/10/03

❖ අපගේ ත්‍රෛමාසික දාන-ශීල-භාවනා වැඩසටහන 2010/10/03 ඉරුදින සිංහරාජ බෙරලිය මුකලානේ දියවැටි කන්දේ පිහිටි තපෝවන සෙනසුනේදී පැවැත්වේ.

❖ මෙදින කොළඹ සිට සහභාගී වන අප සාමාජිකයින්ගේ ප්‍රවාහන පහසුකම් සඳහා බස්රථ 10 පමණ වෙන්කර තිබේ.

❖ 2010/10/03 ඉරුදින පෙ.ව. 6.00 ට කොළඹ 07 බෞද්ධාලෝක මාවතේ පිහිටි ධම්ම ගවේෂී බෞද්ධ ආශ්‍රමයෙන් බස්රථ කීපයක් පිටත්වන අතර සියළු බස්රථ පෙ.ව.6.15ට වැල්ලවත්ත පෙඩ්රිකා පාරේ ශ්‍රී විජයාරාමයෙන් පිටත්වේ.

❖ ඒදිනට පැමිනෙන සියළු දෙනා සිල් ගැනීමට සුදුසු ඇඳුමකින් සැරසී පැමිනිය යුතුය.

❖ මෙදින හීල් දානය හා දහවල් දානය සඳහා තම තමන් විසින්ම පලතුරු වෙනත් අයකුට සෑහෙන සේ රුගෙන එනනේ නම් මැනවි. පානීය ජලය එම ස්ථානයේ ඇත, අවශ්‍ය නම් බෝතලයක් රුගෙන එන්න.

❖ ඉඳගෙන භාවනා කිරීම සඳහා කුෂන් එකක් හෝ කුඩා කොට්ටයක් වැනි (ඉටිකොල හැර) යමක් රුගෙන ආවාට කම් නැත.

❖ ප්‍රවාහන ගාස්තු සඳහා බර පැන රු. 500.00 ක් වේ.

❖ ඉතා කුඩා බස් රථ රැගෙන යාමට සිදුවී ඇති බැවින් සාමාජික නොවන අය සහභාගී කරගත නොහැක.

❖ ආසන වෙන් කිරීම 2010/09/26 ට පෙර කාර්යාලයට මුදල් ගෙවන්න.


❖ මගදී බස් රථ වලට නගින අය සමලේකම් බී.ඩබ්. චමින්ද මහතා අමතන්න. ( 0777-255607 )

❖ ආසන වෙන් කිරීම 2010/09/26 ට පෙර පැමිණ හෝ මෙත්සවිය නමින් ලියන ලද චෙක් පතක් හෝ මුදල් ඇනවුමක් කාර්යාලයට එවීමෙන් කල හැක.

## තපෝවන සෙනෙසුන පිළිබඳව

- වනවාසී භාවනානුයෝගී භික්‍ෂුන් වහන්සේලා 08 නමක් හා වෙනම අරණ්‍ය භික්‍ෂුණීන් වහන්සේලා 03 පමණද වැඩවසයි.
- නිතර වැස්ස ඇති නිසා දිය උල්පත් හරස් කොට මෙම ස්ථානයට ජලය සැපයීමට, මෙත්සවිය මගින් සාමාජිකයින්ගේ ධණ පරිත්‍යාගයෙන් කටයුතු කර ගෙන යනු ලැබේ.
- අට මහා කුසලයක් වන මේ සඳහා ධන පරිත්‍යාග කාර්යාලයට හෝ ගමන සිදු කරන දින එම ස්ථානයේදීම සිදු කල හැක.

  ගිහි පින්වතුන්නට (උපාසක,උපාසිකා) මෙහි ගොස් භාවනා කිරීමේ පහසුකම් ඇත.
- අපවත් වී වදාල ස්වාමීන් වහන්සේලා දෙනමක ගේ මෘත ශරීර නරක් නොවී තිබෙන අයුරු මෙහිදී දැක ගත හැක. ඔබ මෙතෙක් දැක නැති තායිලන්ත වැනි රටවල ඇති වන සෙනසුන් ( Forest Monastery ) වලට සමාන සුන්දර පරිසරයක මෙය පිහිටා තිබේ.
- කඳු නැගීමට ඇති නිසා වයසක අය/අපහසුතා ඇති අය පැමිනීමෙන් වලකින්න.
- වියලි ආහාර, වළං, පාත්තර ( මෙත් සවියෙන් විමසන්න. ) ආදිය පූජා කල හැක.




තනිව පැමිනෙන සාමාජිකයින් සඳහා දළ ගමන්මාර්ගය









අපවත් වී වදාල ස්වාමීන් වහන්සේලා දෙනමක ගේ මෘත ශරීර

# මෙත් සවිය

## මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

ශ්‍රී විජයාරාමය, ෆෙඩ්‍රිකා පාර, කොළඹ - 06

දුක : 0714 014467 දුක/ෆැක්ස් : 011 2505088 වෙබ් අඩවිය : www.methsaviya.org විද්‍යුත් තැපෑල : office@methsaviya.org


## අප ගැන වචනයක්.....

මෙත් සවිය සංසදය නිරවුල් මනසක් ඇති වර්ධනය කරගත් ශක්තියක් සහිත බුද්ධිමත් ශ්‍රී ලංකික ජනතාවක් බිහි කිරීමේ අරමුණින් අරඹන ලද සාමාජිකයින්ගේ එකතුවකි ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදාළ විශේෂඥයින් හා උගතුන් ගෙන්වා සාමාජිකයින් දැනුවත් කරනු වස් විවිධ වැඩසටහන් මෙමගින් පැවැත්වීමට බලාපොරොත්තු වේ. වැඩසටහන් සඳහා මාතෘකා තෝරා ගැනීමද සාමාජිකයින්ගේ කැමැත්ත/ඉල්ලීම මත සිදුකරනු ලැබේ. සංසදය විසින් පවත්වනු ලබන සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත් වන අන්දම, කාල කළමනාකරණය, නායකත්වය, ත්‍රෛමාසික චිත්ත සංයම අභ්‍යාසය හා භාවනා වැඩසටහන් සඳහා සහභාගී වීමේ වරප්‍රසාදය සියලු සාමාජිකයන්ට හිමිවේ. මීට අමතරව සාමාජිකයින්ගේ දැනුම හා ශික්ෂණය වර්ධනය කිරීම සඳහා සෑම මාස තුනකටම වරක් දාන-සීල භාවනා වැඩසටහන්ද පවත්වනු ලැබේ. සංසදයේ ප්‍රධාන නිලතල දරණ විධායක කමිටු හා ක්‍රියාකාරී කමිටු සාමාජිකයින් මාංශ භක්ෂණයෙන් හා රහමෙර පානයෙන් තොර දිවි පැවැත්මක් ඇති අය වීම මෛත්‍රී පෙරදැරිව කටයුතු කරන මෙම සංසදයේ විශේෂත්වයකි.

### මෙත් සවිය විධායක කමිටුව 2010

**ගරු අනුශාසකවරු**

ශ්‍රී විනයාචාර්ය ශ්‍රී ධර්ම රක්ෂිත වංසාලංකාර අමරපුර නිකායේ අධිකරණ සංඝනායක අතිපූජ්‍ය අහංගම ආනන්ද මහා ස්ථවිරයන් වහන්සේ

භාවනා කම්මට්ඨානාචාර්ය අතිපූජ්‍ය මඩවල උපාලි මහා ස්ථවිරයින් වහන්සේ

**ගරු සභාපති**

විද්‍යා කීර්ති,ශාසනදීපන, ලෝකාර්ථචාරී විද්‍යාවාචස්පති දේශමාන්‍ය, විශ්ව විද්‍යා අධිමානසික විද්‍යාවේදී නාලන්දා කීර්ති ශ්‍රී ආචාර්ය චන්දන ජයරත්න මහතා

**ගරු උප සභාපතිවරු**

ඉංජිනේරු සරත් ඉලංගතිලක මහතා

නිහාල් මෙන්ඩිස් මහතා

**ගරු සම ලේකම්වරු**

තුසිත දොඹගොඩ මහතා

චමින්ද බලවෙදගේ මහතා

**ගරු භාණ්ඩාගරික**

වාසනා රණසිංහ මහතා

**ගරු උප භාණ්ඩාගාරික**

ජනක සුවඳරත්න මහතා

**සංස්කාරක**

සෙනරත් බණ්ඩාර බුළුමුල්ල මහතා

**පරිගණක සංස්කාරක සහ වෙබ් අඩවි කළමණාකරු**

චමිල ප්‍රසන්න මහතා

**ගරු කාරක සභිකවරු**

නාලක විදිරිසිංහ මහතා

ජී සූරිය ආරච්චි මහතා

සුසන්ත යාපා මහතා

රංජිත් සොයිසා මහතා

එස්.කේ.කළුබෝවිල මහතා

බන්දු අබේරත්න මහතා

### සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු සහ ඉදිරි වැඩසටහන් පිළිබඳ විස්තර

#### මීළඟ 20 වන චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන

2010 නොවැම්බර් 14 දින ඇරඹීමට නියමිත අතර ඒ සඳහා අයදුම්පත් 2010 ඔක්තෝම්බර් 10 දිනට පෙර කාර්යාලයට ලැබීමට සලස්වන්න.

#### සාමාජිකයින් සඳහා සහ සාමාජිකයන්ගේ පවුල්වල අය සඳහා නොමිලයේ ඇස් කණ්නාඩි පරීක්ෂාව හා ඇස් කණ්නාඩි ලබාදීම

2010 ඔක්තෝම්බර් 17 වන දින පෙ.ව. 9.30 සිට ප.ව. 2.00 දක්වා වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

#### අංගොඩ මානසික රෝහලේ නේවාසික රෝගීන්ගේ අවශ්‍යතා ඉටු කිරීම

අංගොඩ මානසික රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන 150 දෙනෙකුට පහත සඳහන් අවශ්‍යතා සපුරාලීමට සිදුව ඇති බැව් දැනුම් දී ඇත.

1. සරොම් 150
2. ප්ලාස්ටික් පිඟන් 150
3. පැදුරු 150
4. මේස් බැනියම් 150
5. ප්ලාස්ටික් කෝප්ප 150 ක්

මේ සඳහා එක් කට්ටලයක් වෙනුවෙන් අවම වශයෙන් රු: 1000 පමණ වියදමක් දැරීමට සිදුවේ. සම්බන්ධ වීමට කැමැති පිංවතුන් කාර්යාලයට දැනුම් දෙන්න. දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

## පළමුවෙනි ඉරුදින මාසික රැස්වීම්

සෑම මසකම පළමුවෙනි ඉරුදින සිරිත් පරිදි අනිවාර්යයෙන් දාන-සීල-භාවනා වැඩසටහන් සඳහා සඳහම් චාරිකාවේ නොයෙදන දින වලදී) මාසික රැස්වීම් සහ විශේෂ දේශනය කොළඹ 07 බෞද්ධාලෝක මාවතේ පිහිටි ධම්ම ගවේශි බෞද්ධ ආශ්‍රමයේ දී පැවැත්වේ. එහෙයින් දැන්වීමක් ලැබුනද නොලැබුනද සෑම මසකම පළමුවන ඉරුදින (සඳහම් චාරිකාවල යෙදන දින වලදී හැර) ඉහත මාසික රැස්වීම් සඳහා ප.ව 2.00 - 4.00 අතර කාලය තුල පැමිණෙන ලෙස සියලු සාමාජිකයින්ගෙන් මෙත් සිත් පෙරදැරිව ඉල්ලා සිටින්නෙමු. ඉදිරි වැඩ සටහන් පිළිබඳ තොරතුරු වෙබ් අඩවියෙන්ද ලබාගත හැක. මෙම වැඩ සටහන සඳහා දිවයිනෙහි සුප්‍රසිද්ධ ධර්මදේශක ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමක් වැඩම කරවීම හෝ පෞරුෂ වර්ධනය යෝග වැඩසටහන් ආදී විශේෂිත වැඩසටහනක් හඳුන්වාදීම සඳහා ගිහි භවතකු හට හෝ ආරාධනා කරනු ලැබේ. මේ සඳහා වන සාමාජිකයින්ගේ යෝජනා වෙතොත් සභාපති/ලේකම් තුමා වෙත දන්වන්න.

## මෙත් සවිය ප්ලාස්ටික් හැඳුනුම්පත

ඡායාරූප වලට පෙනී සිටි මෙතෙක් ප්ලාස්ටික් හැඳුනුම්පත් නොගත් සාමාජිකයන්ට ඒවා කාර්යාලයයෙන් ලබාගන්නා ලෙස ඉල්ලා සිටිමු.

## සාමාජිකත්වය අළුත් කිරීම

සාමාජික පත්‍රයේ සඳහන් සාමාජිකත්වය වලංගු සීමාවේ දිනයට පෙර සාමාජිකත්වය අළුත් කර ගැනීමෙන් මෙත් සවිය සවිමත් කර ඉදිරි පුණ්‍ය කටයුතු කරගෙන යෑමට දායක වන ලෙස මෙත් සිත් පෙරදැරිව මතක් කරමු. ඒ සඳහා කාර්යාලයට පැමිණීම අත්‍යාවශ්‍ය නොවන අතර, ඒ වෙනුවෙන් ගෙවිය යුතු රු.500/=ක වාර්ෂික සාමාජික ගාස්තුව මෙත් සවිය නමින් ලියන ලද රේඛණය කල චෙක්පතක් හෝ ගෙවන කාර්යාලය. "වැල්ලවත්ත" ලෙස සටහන් කල මෙත් සවිය නමට එවන සාමාන්‍ය මුදල් ඇණවුමක් තම ලිපිනය ලියු රු.30/=ක මුද්දර කවරයක් හා පැරණි සාමාජික පත්‍රයද සමග ලියාපදිංචි තැපෑලෙන් ලේකම්,මෙත්සවිය, ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ 06 වෙත එවීමෙන් අළුත් සාමාජික පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් ලබා ගත හැකි බවද කාරුණිකව දන්වමු.

## සාමාජිකයින් සඳහා සහ සාමාජිකයන්ගේ පවුල්වල අය සඳහා නොමිලයේ ඇස් කණ්නාඩි පරීක්ෂාව හා ඇස් කණ්නාඩි ලබාදීම

ඉදිරියේදී පැවැත්වීමට නියමිත ඉහත වැඩ සටහන සඳහා කණ්නාඩි කිහිපයක් හෝ ලබාදී දායක වීමට කැමති පිංවතුන් වෙත්නම් සභාපතිතුමා / ලේකම්තුමා වෙත දැනුම් දෙන්න.

## මෙත් සවිය නොමිළයේ නීති උපදෙස් සේවය

සාමාජිකයින් සඳහා අවශ්‍ය නීති උපදෙස් කෙටි වශයෙන් දුරකතන මගින් හෝ මසකට වරක් හමුවී හෝ ලබා දීමට කැමති සාමාජික නීතීඥ මහත්ම මහත්මීන් වෙතොත් කාරුණික සභාපතිතුමා වෙත/ ලේකම්තුමා වෙත හෝ කාර්යාලයට දන්වන්න.

## පූජාභූමි වල පානීය ජල ටැංකි සවිකිරීම/ පැන් පහසුකම් තැනීමේ ව්‍යපෘතිය

පූජනීය සිද්ධස්ථානවල ස්වාමීන් වහන්සේලාට හා වන්දනාකරුවන් සඳහා මෙත් සවිය මගින් පැන් පහසුකම් සඳහා ජල ටැංකි/ජල නල/කරාම ආදිය සවිකර දීමේ සද්කාර්යයක් අරඹා ඇත. ඔබගේ නමද සටහන්ව මෙම ටැංකි අනුරාධපුරය/පොළොන්නරුව වැනි ස්ථාන වල පමණක් නොව අවශ්‍ය වෙනත් සිද්ධස්ථාන වලද පවා තනා එම සිද්ධස්ථාන වලට එන පිංවතුන්ගේ පවස නිවීම ට කැමති සාමාජිකයන් වෙතොත් තම කැමැත්ත සභාපතිතුමා / ලේකම්තුමාට හෝ කාර්යාලයට දන්වන්න. අවශ්‍ය විටදී අප ඔබව අමතන්නෙමු. මේ සඳහා රු. 10000/= 30000/= දක්වා (ස්ථානය මත වෙනස් වේ.) වියදමක් දැරීමටද සිදුවිය හැක. තනිව හෝ කිහිපදෙනෙකු එක්වද මේ සඳහා දායක විය හැක. පැන් පහසුකම් අවශ්‍ය සුදුසු සිද්ධස්ථාන වෙතොත් අප වෙත දන්වන්න.

## සංසදයේ ලිපි කටයුතු සඳහා මුද්දර පරිත්‍යාග

සංසදයේ ලිපි ගනුදෙනු කටයුතු සඳහා මුද්දර ගාස්තුව ලෙස විශාල මුදලක් වැයකිරීමට සිදුවී ඇති අතර, මෙම සද්කාරය සඳහා මුද්දර පරිත්‍යාග කිරීමට කැමති පින්වතුන් හට රු.10/= මුද්දර කැමති ප්‍රමාණයක් පරිත්‍යාග කල හැකිය. ලබා දෙන මුද්දර ප්‍රමාණය ඒ සඳහා ඇති ලේඛනයේ සටහන් කරනු ලැබේ. මුද්දර 10ට වැඩි ඕනෑම ප්‍රමාණයක් පරිත්‍යාග කරන විට සටහන් පොතට ඇතුල් කරනු ලැබේ. මෙත් සවිය සංසදයේ පැවැත්මට හා එහි වර්ධනය සඳහා ඔබගේ ශාසනාලයැති දායකත්වය අගය කරන්නෙමු.

# දියේ ගිලෙන අය බේරා ගැනීමට කැමති අය සඳහා මෙත් සවිය ජීවිතාරක්‍ෂක (Life Saving) නියමු කණ්ඩායම පුහුණු කිරීම

## මෙම අභය දානමය පුණ්‍ය කර්මය සඳහා ඔබගේ දායකත්වය බලාපොරොත්තු වෙමු.

ප්‍රචණ්ඩ මුහුදේ දරුණු රළ ගෙඩියකට මැදිව යට යමින් මතුවෙමින් මරු සමග බිහිසුනු සටනකට මැදි වූ අසරණයකුගේ දර්ශනයක් නෙත ගැටෙන කාගේත් හදවත කම්පාවනුයේ නිරායාසයෙනි.

මේ අතර ආධුනික ජීවිතාරක්‍ෂකයා එවැනි අවස්ථාවක් එන තෙක් විමසිල්ලෙන් බලා සිටියි. මහජන ප්‍රණාමය, කීර්තිය, ත්‍යාග භෝග ආදියෙන් තම විවිධ අඩුපාඩු මෙතුළින් සපුරා ගැනීමට හැකිවන පසුබිමක් ගැන ඔවුහු සිහින මවති. එවැනි නිර්භීත ක්‍රියා සඳහා ජනමාධ්‍ය මගින් ලබා දෙන පුළුල් ප්‍රචාරය තුළින් තව නවත් වීරයන් බිහි කිරීමට දිරිමත් කිරීම අගය කළ යුතුය.

මෙම නිර්භීත තරුණයෝ අභයදානමය පින පිළිබඳව එතරම් තැකීමක් නොකරති. නමුත් ධර්මදානය පින මෙයටත් වඩා බලවත් බව පැවසූ අවස්ථාවලදී ඔවුහු තරමක් තැති ගැනීමකට ලක් වෙති. එය එසේ නොවිය යුතුය. සිය පන නල පරදුවට අන් දිවියක් ගැලවීම දහම් පදයකින් කෙසේ අභිබවා යන්නේ දැයි ඔවුන්ගේ තර්කය විය.

මෙහිදී ඔවුන්ගේ මානසික තත්වය අනුව නිදර්ශනයක් වශයෙන් මසුන් මැරීම ජීවනෝපාය කර ගත් ධීවරයකු දියේ ගිලීමකදී ගලවා ගතහොත් ඇතිවන පසුබිම සාකච්ඡා කළෙමු. ඔහු ඉතිරි ජීවිත කාලය පුරාම සුගතිගාමී නොවුනහොත් බොහෝ විට තවදුරටත් මසුන් මරා අකුසලය තීව්‍ර කර ගන්නා ආකාරය පැහැදිලි කළ විට එය පහසුවෙන් වටහා ගත්තේය. එසේම නැවක ගමන් ගත් හත් සියයක් දෙනා දියේ ගිලීමේදී පන්සිල්හි පිහිටුවීමෙන් ඔවුන් සියල්ලම නිදා සිට අවදි වූ ආකාරයට දෙව්ලොව ගිය කතා පුවත ඉදිරිපත් කිරීමේදී මෙම තරුණයින් පහසුවෙන් ගැඹුරු දහමක් පිළිබඳව කිසියම් නිවැරදි අදහසක් හද තුළ තැන්පත් කර ගැනීමට සමත් වූ බව අවබෝධ විය.

මෙරටේ වසරකට දහසකට වැඩි ප්‍රමාණයක් දියේ ගිලී මිය යති. මෙය පහසුවෙන් වලකාලීමට විවිධ උපාය මාර්ගයන් සුලබය. අඩුම වශයෙන් වසර දහසකට පමණ වැඩි කාලයක් තුළ අනුරාධපුර පොසොන් උත්සව සතියේ වන්දනාකරුවන් අනාරක්ෂිත වැව් වල ජල ස්නානයට බැසීමට යාමෙන් සෑහෙන පිරිසක් අනතුරට පත් වී ඇතැයි සිතීමට ප්‍රමාණවත් කරුණු ඇත. වසරකට අඩුතරමින් 15 දෙනෙක්වත් දියේ ගිලී මිය යන ආකාරය 1978 වසරෙහිදී මා සියැසින් දැක ගතිමි. දියේ ගිලී මිය යාම මෙම උත්සවයත් සමග එකට බැඳී ඇති සාමාන්‍ය සිද්ධියක් ලෙස සලකා නිහඬ වීමට වගකිව යුත්තෝ පුරුවී සිටියහ. 1979 වසරෙහිදී පුහුණු ජීවිතාරක්‍ෂකයින් වැව් වල සේවයට යෙදවීමෙන් මෙම අනතුරු පහසුවෙන් වළකාලිය හැකි බව පෙන්වා දීමට හැකි විය. මෙහිදී එවකට පොලිස්පති ආනා සෙනෙවිරත්න මහතාත් එතුමන්ගේ පුද්ගලික සහායක ජ්‍යේෂ්ඨපොලිස් අධිකාරිව සිටි ආරියසිංහ මහතාත් ලබා දුන් සහාය ගෞරවයෙන් සිහිපත් කළ යුතුය.

වැව් කිහිපයක තැනින් තැන කිලෝ මීටර් 10 ක පමණ දුර ප්‍රමාණයක ජ්‍යෙෂ්ඨ ජීවිතාරක්‍ෂකයින් යෙදවීම අපහසු වුයෙන් සහායට පුහුණුව ලැබූ පාසල් සිසුන් යෙදවීමට ගත් තීරණය අතිශයින් සාර්ථක විය. ඊගල් රක්‍ෂණ සමාගමේ අනුග්‍රහයෙන් කළ මෙම සේවය නිසා දැනට සිසුන් 600 කට ආසන්න ප්‍රමාණයක් පොසොන් උත්සව සමය එළඹෙනතෙක් වසර පුරා සූදුසුකම් දියුණු කර ගනිමින් මෙම කණ්ඩායමට ඇතුළත් වීමට යුහුසුළු වෙති ජලයට ප්‍රිය ළමා වයස මෙම කර්තව්‍යයට කදිමට ගැලපුණි. අලුයම සිට අඳුර වැටෙන තෙක් මොවුන් ජලයේම රැඳී සතුටින් සෙල්ලම් කරමින් කාලය ගතකරමින් වන්දනා කරුවන්ගේ ආරක්‍ෂාවද නොමදව ලබා දීම තුළින් ළමා හැකියාවන්ටද වගකිව යුතු කාර්යයක් ඉටු කිරීමට සුදුසු පසුබිම් අති බවට වැදගත් පණිවිඩයක් සමාජයට ලබා දුනි.

## අභය දානයට පහසු මඟක්

දිය අනතුරු වැළකීමට පිහිනීමට අවශ්‍ය නොමැත. පිහිනීමට නොහැකි වැඩි දෙනා දියේ ගිලෙනුයේ ගොඩ සිට අඩි 4ක් හෝ 5ක් පමණ ඈතිනි. මෙවන් අවස්ථාවක පාවෙන යමක්, දිග ලීයක, පොල් අත්තක්, කොටයක්, වාහන අමතර රෝදයක් පහසුවෙන් ගිලෙන්නාගේ අතට පත් කළ හැකිය. නමුත් පුහුණුවක්, පෙරහුරුවක් තුළින් මෙම උපායත් සිත් තුළ තදින් කාවැද්දවීමක් සිදු කර නොමැති පසුබිමක බොහෝ දෙනා තෘෂ්ණිම්භූත (Excitement) වෙති. සමහරු දියේ ගිලෙන දර්ශනයෙන් බලවත් ලෙස කම්පාවට පත්වෙති.

## අශාස්ත්‍රිය ප්‍රථමාධාර

එසේම සිහිසුන් වුවකුට වහා කෘතීම ස්වසනය දීමෙන් ගලවා ගත හැකිය. නමුත් අශාස්ත්‍රිය ක්‍රමයන් නිසා සිදුවන හානිය බරපතලයි දියේ ගිලූන අයෙකුගේ දෙපයින් ඔසවා බඩේ වතුර ඉවත් කිරීම තුළින් සිහිසන් වුවෙකුගේ ස්වසන මාර්ගයට ජලය ගලා යාමෙන් සිදුවන හානිය තව තවත් දරුණු වීම වැළැක්විය නොහැකිය.

පවතින මතය වැළකීමට තවදුරටත් සෑහෙන මහන්සියක් ගත යුතුව ඇත. මේ පිලීබඳව වරක් මා 2002 වසරෙහි නෙදර්ලන්තයේදී පැවති දියේ ගිලීම□ ගලවා ගැනීම□ ප්‍රතිකාර හා වළකාලීම පිළිබඳව ලෝක විද්‍යාඥ සම්මේලනයේදී අනෙකුත් විද්‍යාඥයින්ගේ දැන ගැනීමට මෙම කරුණ ඉදිරිපත් කළෙමි. ඔවුන්ගෙන් ලද පිළිතුර විස්මයට හේතු විය. එම රටවලදී තව දුරටත් එසේ ක්‍රියා කරන්නෝ සිටින බව හෙළි කරන ලදි. මෙය අතීතයේ විදේශිකයින්ගෙන් අප රටවාසීන් පුරුදු වී ඇති බවක් සිතා ගත හැකිය.

දැනට වැල්ලවත්ත සුගත ළමා නිවාසයේ සහ වෙරළාසන්නයේ පාසැල් සිසුනට මෙම සේවය නොමිළේ ලබා දීමට සාර්ථක වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වෙමින් පවතී. මෙත් සවියේ සාමාජිකයිනට මෙම වැඩ සටහනට සහභාගී වි දින කිහිපයක් විපතට පත්වන්නකු ගලවා ගැනීමේ හැකියාව ලබා දිය හැකිය. වැල්ලවත්ත කින්රෝස් සමාජයේ පිහිනුම් තටාකය සුදුසු පරිදි සුළු ගෙවීමකින් වෙන් කරවා ගැනීමෙන් නොකඩවා මෙම පන්ති සැලසුම් කර ගත හැකිය. අඟහරුවාදා සහ බ්‍රහස්පතින්දා පිවිිි230 වනතෙක් දිනකට 30 කට පමණ මෙම පන්ති නොමිලේ මෙහෙයවිය හැකිය.

මූලික ජීවිතාරක්‍ෂක පුහුණු පාඨමාලාවට පැය 12 ක් පමණ ගතවන අතර එමගින් ගොඩ සිදුවන අනතුරු 40 කදී පමණ දිවි ගලවා ගැනීමට හැකියාවක් ලැබෙති.

## පෙර ඥාතීන්ට පිහිට වෙමු.

අප කවුරුත් ජීවත්ව සිටින පිරිස් වල යහපතට කතා කළද තවත් අප නොසිතන පැතිකඩක් ඇති බව මෙත් සවිය පන්තිවලදී පැහැදිලි විය. ලොව පුරා දිනකට හදිසි අනතුරු තුළින් විනාශ වන ජීවිත ප්‍රමාණය දළ වශයෙන් දස දහස් ගණනක් බව සිතා ගත හැකිය. මොවුන්ගේ සෑහෙන පිරිසක් තවදුරටත් එම වේදනාවෙන්ම වසර සිය ගණන් දුක් විඳිමින්



ගන්ධබ්බ, ප්‍රේත, අමනුෂ්‍ය, ආදි විවිධ ගුප්ත ආත්මයන්හි සැරි සරන බව විවිධ අවස්ථාවන් වලදී විද්වතුන් පෙන්වා දී ඇත. මොවුන් ජීවත්ව සිටින අබ්බගාතයින්ට වඩා අසරණව සිටින බව පැහැදිලිය. තම දුක කීමට හෝ ඇසීමට කෙනෙකු නොමැතිව නමුත් ඉතා සරල විනාඩි කීපයක සැලසුමකින් පිහිට විය හැකි මට්ටමේ සිටින ගුප්ත ආත්ම අති විශාල බව වාර්තා වෙයි. වරක් මෙවැන්නකු තුසිත දෙව්ලොව පහළවීමෙන් නිවන් මගට පත්වුන ප්‍රමාණය සුවිසි අසංක හැටපන් ලක්‍ෂ විසිපන් දහසක් වන අතර□ මෙම විශාල සංඛ්‍යාවෙන් මිනිසුන්ගේ ප්‍රමාණය සියයට එකක් තරම් අල්ප බව වු අපගේම අතීත ඥාති මිත්‍ර දූ දරු සහෝදර දෙමාපියාදීන් විශාල ප්‍රමාණයකට එම දුක් වලින් මුදවාලීමට ඇති අවකාශය පැහැර හැර නිහඬ වෙමුද?

ඉදිරියේ එන බුද්ධාලෝකයත් සමඟ මෙම කරුණත් කාගේත් සිත් තුළ තැන්පත් කරනුයේ කරුණාවෙනි ක්‍රියාවට නැංවීමට කාලය එළඹී ඇති බැවින් සුදුසු මගක් පෑදේවා යයි පතමි.

මෙත් සවිය සභාපතිතුමාගේ ඉල්ලීමක් මත ප්‍රවින ජීවිතාරක්‍ෂක නිලධාරි පියදාස සිල්වා මහතාගේ කැමැත්තෙන් කරනු ලබන මෙම සද්ක්‍රියාවට දායක වීමට හැකි නීරෝගී මෙත් සවිය සාමාජිකයින් තම නම හා ලිපිනය කාර්යාලයට ලබා දෙන ලෙස ආචාර්ය චන්දන ජයරත්න මහතා ඉල්ලා සිටී. පිහිනුම් තටාක ගාස්තු මෙත් සවිය මගින් ගෙවනු ලබන සහ පුහුණුව සිල්වා මහතා විසින් නොමිළයේ ලබා දෙනු ඇත. පුහුණුව ලත් කැමති අයට වෙසක්,පොසොන් දිනවල අනුරාධපුරය, පොළොන්නරුව වැනි ස්ථාන වල වැව් ආසන්නයේ ස්ථාපිත සේවයේ යෙදවිමද කළ හැකිය.

**පියදාස සිල්වා වීජ**
**2002 නෙදර්ලන්තයේ පැවති දියේ ගිලීම, ගලවා ගැනීම, ප්‍රතිකාර හා වළකා ගැනීම පිළිබඳව ලෝක විද්‍යාඥ සම්මේලනයේ ශ්‍රී ලංකා නියෝජිත**

# සිල් පදයක අරුත...

## කාම මිථ්‍යාචාර කර්මය සම්පූර්ණ වීම සඳහා පහත අංග හතර සම්පූර්ණ විය යුතුය.

1. සේවනය නොකළ යුතු ස්ත්‍රියක හෝ පුරුෂයකු වීම.
2. සේවන චිත්තය ඇති වීමය.
3. සේවනයට උත්සාහ කිරීමය.
4. සේවන ඉවසීමය (හෙවත් එහි ආස්වාදය විඳීමය).

උදාහරණයක් ලෙස ස්ත්‍රිහු ගනිමු. ඉහත සේවනය නොකළ යුතු ස්ත්‍රීන් ලෙසට පහත ස්ත්‍රීන් දස වර්ගය ඇතුළත් වේ.



### දස ඉත්ථියෝ (ස්ත්‍රීන් දස වර්ගය)

- මව විසින් රක්නා ලද්දිය, — මතු රක්ඛිතා,
- පියා විසින් රක්නා ලද්දිය, — පිතු රක්ඛිතා,
- මව්පියන් විසින් රක්නා ලද්දිය, — මාතාපිතු රක්ඛිතා,
- සොහොයුරා විසින් රක්නා ලද්දිය, — භාතුං රක්ඛිතා,
- සොහොයුරිය විසින් රක්නා ලද්දිය, — භගිනි රක්ඛිතා,
- ඥාතීන් විසින් රක්නා ලද්දිය, — ඤාති රක්ඛිතා,
- කුලගෝත්‍රයා විසින් රක්නා ලද්දිය, — ගොත්ත රක්ඛිතා,
- ධර්මය මගින් රක්නා ලද්දිය, — ධම්ම රක්ඛිතා,
- ආරක්‍ෂා සහිතව සිටින්නිය (තමා විසින්ම) — සාරක්ඛා රක්ඛිතා,
- දණ්ඩාරක්ෂකයන් ඇති (දණ්ඩක් ආරක්‍ෂාවට තබා ගත්) සපරිදණ්ඩා රක්ඛිතා,

මෙම ස්ත්‍රීන් දස වර්ගය අනුන් විසින් ආරක්‍ෂා කරන්නියක් ලෙස සැලකෙයි. නිදසුනක් වශයෙන් මව හෝ පියා විසින් රක්නා ලද්දිය. කිසිදු අනතුරකට භාජනය නොවන පරිද්දෙන් සුරක්ෂිතව සිටින්නියකි. කාමයෙහි හැසිරීම පිළිබඳ ශික්ෂාපදයේ දී මෙම ස්ත්‍රීන් දස දෙනාගෙන් කෙනෙකු සමඟ කාමසේවනයෙහි යෙදීම වරදවා කාමයෙහි හැසිරීමක් ලෙස දැක්වෙයි.

*විනය පිටකය ඇසුරෙනි*

*සැකසුම :- ආචාර්ය චන්දන ජයරත්න*

---

## උපාසක ගුණ මෙසේ හඳුනා ගනිමු.

මිලිඳු මහරජතුමාට උපාසකයකු තුළ තිබිය යුතු ගුණ දහයක් නාගසේන හිමියන් විසින් මෙසේ පෙන්වා දෙයි. එම ගුණ දහය මෙසේයි.

1. මේ ශාසනයෙහි උපාසක තෙමේ සංඝයා හා සමාන සුවදුක් ඇත්තේ ධර්මයම අධිපති කොට ඇත්තේ වෙයි.
2. දන්දීමෙහි ඇලුනේ වෙයි.
3. සර්වඥ ශාසනයාගේ පිරිහීම දැක එය නගාසිටුවීමට උත්සහ කරන්නේ වෙයි.
4. දුරු කරන ලද කොතුහල මංගල ඇත්තේ සම්‍යක් දෘෂ්ඨි ඇත්තේ වෙයි.
5. තම ජීවිතය නිසාවක් සර්වඥයන් වහන්සේ හැර අනෙකකු තමාගේ ශාස්තෘවරයා වශයෙන් නොදක්වන්නේ වෙයි.
6. කාය කර්මයන් හා වාක් කර්මයන් ආරක්‍ෂා කරන්නේ වෙයි.
7. සමගියෙහි ඇලුනේ වෙයි.
8. ඊර්ෂ්‍යා නොකරන්නේ වෙයි.
9. අන්‍යයන් රැවටීමට සර්වඥ ශාසනයෙහි හැසිරෙන්නේ නොවෙයි.
10. බුදුන්, දහම්, සඟ, සරණ ගියේ වෙයි.

ඉහත ගුණ දහය කියවා බලා තමන් තුලද මෙකී ගුණ වැඩි දියුණු කර ගැනීමට උත්සාහවත් වන්න. ඔබ තුල මෙම ගුණ ධර්ම කීයක් තිබේද කියා විමසා තමා තුළ පවතින ගුණ තව තවත් වර්ධනය කර ගැනීමට උත්සාහවන්ත වන්න. අප සැවොම ගෞතම බුදු සසුනෙහිම චතුරාර්යය සත්‍යය අවබෝධ කර ගැනීමට උත්සාහ වෙමු.

*එඩ්වඩ්. සමරදිවාකර*

*මෙත් සවිය සාමාජික - 01- 109*

## තිසරණ සරණයි...!

*පින්වත් අප ආචාර්ය චන්දන ජයරත්න මැතිඳුනි,*

ඔබතුමා විසින් මෙහෙයවන ලද මෙත් සවිය සදහම් චාරිකා වැඩ සටහනට සහභාගී වීමෙන් අපද බොහෝ කුසල් රැස් කර ගත්තෙමු. ඒ පිළිබඳව ඔබතුමාට අනේක වාරයක් පින්දෙමි. කාරුණික පියතුමෙක් මෙන් අප ගැන සොයා බලා කටයුතු කළ අතිපූජ්‍ය විජයාරාමාධිපති පින්වත් ස්වාමීන් වහන්සේටත් ගෞරවයෙන් පින්දෙන අතර උන්වහන්සේගේ 79 වැනි ජන්ම දිනයට දිගාසිරි පතමි. අප මෙහෙණිවරු 6 නමක් නොමිලේ එකතු කරගෙන ගොස් සියලු ආරක්‍ෂා පහසුකම් සපයා දී උතුම් බුදු පා පහස ලද නාගදීපය වන්දනා කර ගැනීමට සැලැස්වීමේ පින් බලයෙන් ඔබතුමාගේ සියලුම .යහපත් ප්‍රාර්ර්නා සඵලවේවා...! නීරෝගී සුව දිගාසිරි ප්‍රාර්ථනා කරන බෝධියකින් උතුම් නිවන් සුව අත්වේවායි පතමු. ස්වේච්ඡාවෙන් සේවයේ යෙදුනු කාර්ය මණ්ඩලයටද පින් අනුමෝදන් කරමි.

ඔබතුමාටත්, මෑණියන්ටත්, සැමදෙනාටත්, සියළු යහපත රත්නත්‍රයේ සරණින් ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

### ත්‍රිවිධ රත්නයේ සරණයි...!

*මෙයට*
*විශාඛාරාමාධිපති*
*බඩල්ගම ධම්ම නන්දනී භික්ෂුණිය*
*සාමාජික අංක 12/07*

ඔරුවක් නැති - හබලක් නැති සයුරක් ඇති - වෙරළක් නැති
මේ සසර දනව්වේ අපි අසරණ වෙලා වගේ
හිතට දැනෙනවා බුදු හාමුදුරුවනේ

මා කුඩා කළ සිටම මෙම ගීතය අසා ඇත්තෙමි. සැබැවින්ම මා සිතුවේ ඔරුවක් ඇතිමුත් හබලක් නැති බවය. වෙරළක් නැතිමුත් සයුරක් ඇති බවය. නමුදු මෙත් සවිය ගැන දැනගෙන සැබැවින්ම සවියක් වූ එයට සම්බන්ධව ගත කළ කෙටි කාලය තුළදී මා හබල සොයා ගතිමි. ඉතින් මා හබල ප්‍රයෝජනයට ගනිමින් වෙරළට පියමං කරමි. මනුස්ස ආත්මය නම් ඔරුවේ නැගී, උතුම් ධර්ම දේශනාවක් ශ්‍රවණය කොට□ තේරුම් ගෙන උතුම් භාවනාවක් නම් වූ හබලෙන් සංසාර සාගරය තරණය කොට ඒ උතුම් නිර්වාණය නමැති වෙරළට පියමං කරමි.

මෙවන් විශාල ගමනක් යන්නට සවිමත් අඩිතාලමක් දැමූ සංසාරයේ තමන් අසරණයයි දැනෙන නොදැනෙන සියළු දෙනාට සසරින් එතෙර වීමට පාර කියන අපගේ ආදරණීය ගුරුතුමාණන්ට මෙම සත්කාරය ඉදිරියටත් කරගෙන යාමට ශක්තිය,ධෛර්යය,වාසනාව, නිදුක් නීරෝගී සුවය ලැබේවායි පතමි.

එමෙන්ම මෙත් සවියට පාර කියු සහන් මොරවක සොයුරාණන් ඇතුළු මෙත් සවිය කාර්ය මණ්ඩලයටත් නිදුක් නීරෝගී සුවය පතමි. තෙරුවන් සරණයි.

*සාමාජික අංක - 18-3036*

## තුති කුසුම්...!

සම්ඳා......................නෝ //
මිහිදු මහා...................සම්ඳානෝ

ලොවටම පලකළ
මහකරුණාවෙන්
ජම්බු දීපයෙන්
වැඩම කළා

සම්ඳානෝ..............//
මිහිදු මහා..............සම්ඳානෝ

මිස්සක පව්වෙදි
දෙව්පියතිස් රජ
බුදු බණ පදයෙන්
සැනසුවා..........

සම්ඳා..............නෝ //
මිහිදු මහා..............සම්ඳානෝ

පොසොන් පෝය දින
මේ සිරි ලක්බිම
සදහම් සිසිලෙන්
නැහැවුවා............

සම්ඳා................නෝ //
මිහිදු මහා..............සම්ඳානෝ

*බී.ඒ.හසිනා මධුපාණි අමුපිටිය*
*සාමාජික අංකය - 18-3022*


ඉඩම් මැනීම හා නීතිමය කටයුතු සඳහා
ලක්ෂ්මි සූරිගේ මහත්මිය
නීතිඥ ප්‍රසිද්ධ නොතාරිස් සහ දිව්රුම් කොමසාරිස්
333, කොතලාවල, කඩුවෙල.
දු.ක. 2579100, 2571021, 0778915974


**නාගදීප සදහම් චාරිකාවේ සියළුම දර්ශන ඇතුලත් ඩී.වී.ඩී. පටය කාර්යාලයෙන් මිලදී ගත හැක.**

## 2010.03.07 පැවති සාර්ථකව ඉගෙනගන්නා අන්දම හා විභාග සමත්වන ක්‍රම පිළිබඳ වැඩමුළුවට සහභාගී වූවන්...






මෙම වැඩමුළුවට සහභාගී වූ සියළු දෙනා හට ආහාර පාන සැපයීම
මෙත් සවියේ උප සභාපති සරත් ඉංගකෝන් මහතාගේ ධන පරිත්‍යාගයෙනි.

## මෙත් සවිය අනුශාසක පූජ්‍ය අහංගම ආනන්ද හිමියන්ට අමරපුර නිකායේ අධිකරණ සංඝනායක පදවියෙන් පිදූ දා මෙත් සවියෙන් උපහාර...






## කිලිනොච්චි ලුම්බිනි විහාරයේ මෙත් සවියෙන් ඉදිකරනු ලබන වැසිකිලි 8 කින් යුත් ගොඩනැගිලි පද්ධතිය



බැතිමතුන්ගේ ප්‍රයෝජනයට
දැනට විහාරයේ ඇති වැසිකිලිය




මෙත් සවියෙන් ඉදිකරනු ලබන
වැසිකිලි පද්ධතියේ දළ සැලැස්ම



වැසිකිලිය ඉදිකරනු ලබන භූමිය පරීක්ෂාව




2010 අප්‍රියෙල් මාසික ඉරුදින ධර්ම දේශණය
තලගල භාවනා මධ්‍යස්ථානවෙයි
විදාගම නාගිත හිමියන්




විෂඝෝර සතුන්ටත් අභය දානය

# 2010.04.02 හා 03 යාපනය



අති පූජ්‍ය අභංගම ආනන්ද හිමියන්ගේ මූලිකත්වයෙන්
ධාතුන් වහන්සේලා තුන් නම් නාගදීපයට වැඩම කරවීම



ධාතුන් වහන්සේලා තුන් නම




සුඛෝපභෝගී බස් රථ අටකින් නාගදීපය බලා
පිටත්වීම



කදුරුගොඩ (චුන්නාකම්) පිහිටි රහතුන් වහන්සේලා
60 නමකගේ භෂ්මාවශේෂ තැන්පත් කළ ස්ථූප



සහභාගී වූ සාමාජිකයින්ගෙන් කොටසක්



බෝට්ටු මගින් නාගදීපයට ගමන් කිරීම
(බෝට්ටු සැපයුම නාවික හමුදාව)



උදෑසන කිරිපිඩු පිළියෙල කිරීම



ධාතුන් වහන්සේලා පෙරහැරින් වැඩමවීම



කප්රුක රැගත් පූජා පෙරහැර



උදෑසන කිරිපිඩු පෙරහැරින් රැගෙන යාම



කප්රුක රැගත් පූජා පෙරහැර



කප්රුක පැළඳවීම

# - නාගදීප සදහම් චාරිකාව...



මෙත් සවියෙන් ඉදිකල වැසිකිලි යුනිරල් පද්ධතිය



මෙත් සවියෙන් ඉදිකල වැසිකිලි 6



වැසිකිලි පද්ධතිය සඟ සතු කිරීම



වැසිකිලි ඉදිකිරීමට රු. ලක්‍ෂයක් පූජා කළ රොහාන් ද සිල්වා මයා



වැසිකිලි ඉදිකිරීමට රු. ලක්‍ෂයක් පූජා කළ රංජනී සමරසිංහ මිය



අප්‍රියෙල් 03 වන ජන්ම දිනය සමරන නාගදීප හිමියන්ට ආශිර්වාද කිරීම



සහභාගී වූ සාමාජිකයින්ගේ මුදලින් කොට්ට 300 ක් හා පැදුරු 300 ක් භාරදීම.



ආශිර්වාද පූජාවට සහභාගී වූ සාමාජිකයින්ගෙන් කොටසක්



අතිපූජ්‍ය ආනන්ද හිමියන් අනුශාසනා පැවැත්වීම



ජල පද්ධතිය ඉදිකිීමට ලක්‍ෂ 1 1/2 මුදලක් පරිත්‍යාග කිරීම



සභාපතිතුමා / කමිටු නිළධාරීන් හා නාගදීප විහාරාධිපති



චාරිකාව සඳහා අපට උදව් කල
කමාන්ඩෝ මේජර් දුමින්ද ගලප්පත්ති මහතා, සභාපතිතුමා ඇතුළු
මෙත් සවියේ නිළධාරීන් පිරිස



# Dengue Kills

## Keep your environment clean

Dengue fever is a virus infection caused by the dengue virus. There are 4 kinds of dengue viruses spread among humans by Aedes mosquitoes (Aedes aegypti or Aedes albopictus). It is a flu-like illness which can turn out to be severe. Dengue is also know as Dandy and Breakbone fever.




*Dengue virus*

Dengue is completely preventable. There is no vaccine or specific treatment for Dengue.
The best solution is controlling mosquites and reducing mosquito density.
About 50 per cent of dengue patients are reported from the Western Province




The bite mainly during the daytime, particularly in the early hours after dawn and for 2-3 hours before darkness.


**Life cycle of the Aedes mosquito**




**Potential Breeding Grounds**

**Breeding**

In clean, standing water
This type of mosquito always stays within 150m from residences.
Eggs can withstand desiccation more than a year.
Theoretically, lab test has shown that the infected mosquito can infect her own eggs with the virus.




Control mosquito breeding in water storage containers by using small fish.

### Symptoms



**Dengue Fever**
High fever, loss of appetite, vomitting, severe headache, nausea, pain beneath the eyes, muscle and bone pain. sometimes a rash.

**Dengue Haemorrhagic Fever**
It is a complication of dengue. Internal bleeding, red spots on skin. Bleeding from nose and gums, vomitting with blood, dark stools.Haemorrhagic version of disease can kill by internal bleeding

### What to do?

Maintain body temperature below 39C consult a doctor if the fever remains more than three days

Seek medical attention immediately.
If not managed in time 10%-50% will die.

### Prevent Mosquito Bites




Wear shoes, socks, long pants and long-sleeved shirts

Use mosquito repellents

Mosquito coils

Mosquito nets

- Prevent mosquito bites on DO and DHF patients.



Pistia Stratiotes ("Diya-Parandal", "Kondepasei", "Tel-pasi", "Barawapasei", or "Nanayaviraddi") which afford breeding conditions to mosquitoes should be uprooted and destroyed



Spread the dengue prevention message to others...
Let your family, friends and neighbours know about the dangers of breeding mosquitoes

### Treatment

- No cure
- Patients given bed rest,fluids, paracetamol

Never take aspirin if you have dengue because it may increase your tendency to bleed.

### Do you know...?

- Dengue fever and dengue haemorrhagic fever are the most common mosquito-borne viral diseases in the world.
- Only the female mosquito feeds on blood. This is because they need the protein found in blood to produce eggs. Male mosquitoes feed only on plant nectar.
- The female Aedes mosquito searches for suitable places to lay their eggs.
- The mosquito is attracted by the body odours, carbon dioxide and heat emitted from animals or humans.

*Infographics :*
**Nalin Balasuriya**
Sources: WHO, Epidemiology Unit

## නාගදීප විහාරස්ථානයේ වැසිකිලි සෑදීමට රු. 3000ට වඩා ආධාර කල සාමාජික ලේඛනය

| කණ්ඩායම | සාමාජික අංක | නම | ආධාර මුදල |
|---|---|---|---|
| 14 | 2390 | රංජනී සමරසිංහ මිය | 100,000 |
| 14 | 2501 | රොහාන් ද සිල්වා මයා | 100,000 |
| 15 | 2681 | චමිලා එන්. වීරවර්ධන මෙනවිය | 36,000 |
| 11 | 1976 | මාලනී පෙරේරා මිය | 30,000 |
| 16 | 2743 | එම් සමරක්කොඩි මිය | 30,000 |
| 17 | 2818 | ඩෙබෝරා අත්තනායක මිය | 10,000 |
| 3 | 642ආ | තුෂාරි සඳමාලි ගෝමස් මෙනවිය | 10,000 |
| 16 | 2694 | තුෂානි විදානපතිරණ මෙනවිය | 8,550 |
| 2 | 502 | ප්‍රියවතී කඳනාරච්චි | 8,000 |
| 17 | 2929 | සන්ධ්‍යා ද සොයිසා මිය | 8,000 |
| 17 | භි 2 | පූජ්‍ය උපචාලා භික්ෂුණීන් වහන්සේ | 5,000 |
| 4 | 786 | ආර්.ඩබ්.ගුණරත්න මයා | 5,000 |
| 15 | 2544 | වී.පී.එස්.එම්.සේනාරත්න මයා | 5,000 |
| 17 | 2912 | චන්ද්‍රලතා වටවලගේ මෙනවිය | 5,000 |
| 18 | 2997 | ස්වර්ණා ප්‍රනාන්දු මිය | 5,000 |
| 15 | 2558 | කේ.ඒ.පී. පුෂ්පකුමාර | 4,000 |
| 15 | 2567 | එස්.පී.ජී. හේමකුමාරි මිය | 4,000 |
| 5 | 941 | සමන්ති අහුබුදු මිය | 4,000 |
| 18 | 3007 | ජානකී රණසිංහ මිය | 4,000 |
| 14 | 2415 | ලසන්ත පෙරේරා | 3,800 |
| 6 | 1066 | මනු ආශුබෝධ ද සිල්වා | 3,500 |
| 13 | 2257 | පී. මදුරසිංහ මිය | 3,000 |
| 17 | 2885 | ලක්ෂ්මී ඇනිටා කන්නන්ගර මිය | 3,000 |
| 6 | 1067 | සඳනි මලී මෙය | 3,000 |

# පුණ්‍යානුමෝදනා.....

- බුදු පහසලත් නාගදීප භූමියේ වැසිකිලි පද්ධතිය තැනීමට රු. 3000 ට වැඩියෙන් ආධාර කළ ඉහත පින්වතුන්ට හා රු. 3000 ට අඩුවෙන් ආධාර කළ පින්වතුනට අටමහා කුසල ආනිශංස අත්වේවා...!

- නාගදීප වැසිකිලි පද්ධතිය සඳහා වියදම රු. 450000/= හා ජල පද්ධතිය සඳහා රු. 150000/= ක් පරිත්‍යාග කර ඇත.

## විශේෂ ස්තූතිය...

මෙත්සවිය සාමාජිකා ගලප්පත්ති මහත්මියගේ ස්වාමිපුරුෂයා වන කමාණ්ඩෝ මේජර් දුමින්ද ගලප්පත්ති මහතා විසින් නාගදීප වැසිකිලි තැනීම, චාරිකාවට සහභාගී වූ මෙත් සවිය සාමාජිකයින්ට ආහාර පාන සැපයීම ආදී සියළුම කටයුතු යුධ හමුදාවේ සහය ඇතිව සංවිධානය නොකරන්නට මෙම භාරදූර කාර්යය මෙසේ අපට නිම කිරීමට නොහැකිවීමට ඉඩ තිබුණි. එම නිසා මෙත් සවියේ විශේෂ ආශිර්වාදය දුමින්ද ගලප්පත්ති මහතා සහ එම මහත්මියට හිමිවේ.

නාගදීප චාරිකාවට සහභාගී වූ පිරිසට දින දෙක සඳහාම පානීය ජලය සැපයූ සංගමයේ උප සභාපති සරත් ඉලංගකෝන් මහතාට ද ආශිර්වාදය හිමිවේ.

අවසන් දින රුවන්වැලි සෑය අභියසදී රාත්‍රී ආහාරය සපයාදීමට උදව් දුන් අප සංගමයේ උප සභාපති එස්.අයි. මෙන්ඩිස් මහතා ඇතුළු හිතවතුන්ටද ආශිර්වාදය හිමි වේ.

# ප්‍රේතවස්තු ප්‍රකරණයෙන්

**තවද මේ වස්තු දේශනායෙහි මහ වර්ගයේ දස වෙනි ගණ ප්‍රේත වස්තුව කෙසේද යත්.**

සර්‍වජගදානන්දකර ශාස්තෲ වු බුදු රජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන කල්හි බොහෝ ප්‍රේතයන් අරභයා මේ වස්තුව දේශනා කළ සේක. සැවැත් නුවර බොහෝ මනුෂ්‍යයෝ වනාහි කණ්ඩායමක් වී තුනුරුවන් කෙරෙහි ශ්‍රධා නැතිව අප්‍රසන්නව මසරු මලයෙන් මැකුණු සිත් ඇතිව දානාදී සුචරිත ක්‍රියාවන්ට විරුද්ධව බොහෝකල් ජීවත්ව සිට මරණින් මතු සැවැත් නුවර සමීපයෙහි ප්‍රේත යෝනියෙහි උපන්නාහුය. එකල්හි එක් දවසක් ආයුෂ්මත් මහමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ සැවැත් නුවර පිඬු පිණිස වඩිනාසේක් අතරමගදී ප්‍රේතයන් දැක මේ ගාථාවෙන් අසා වදාළ සේක.



නිදුකාණෙනි තොපි විළිවැස්මක් නැතිව දුර්‍වණ ශරීර ඇත්තාහුය. කෘශ වු ඉල්පීගිය නහරවැල් ඇති උස්ව නැගුණු ඉල ඇට ඇති සම් නහර පමණක් හෙයින් ඉතාම කෘශයහ. තොපි කවරහුදැයි කියා ඇසු සේක. එය අසා ප්‍රේතයෝ කියන්නාහු.

ස්වාමීනී අපි දුකට පත් ප්‍රේතයෝ වෙමු. මිනිස් ලොවදී අකුශල කර්‍ම කොට අපි මිනිස් ලොවින් මැරී ප්‍රේත ලෝකයට පැමිණියෝ වෙමු යැයි කියා ගාථාවෙන් තමන්ගේ ප්‍රේතභාවය ප්‍රකාශ කළහ. නැවත තෙරණුවන් විසින් :-

ප්‍රේතයිනි තොප විසින් කයින් වචසින් මනසින් කිනම් අකුශලයක් කරන ලද්දේද කවර අකුශල කර්‍මයක්හුගේ විපාක හේතුවකින් මිනිස් ලොවින් චුතව ප්‍රේත ලෝකයට පැමිණියෝ දැයි කියා ගාථාවෙන් ඔවුන් පෙර කරන ලද කර්‍මය විචාරන ලද්දේය. එකල ප්‍රේතයෝ තමන් පෙර කළ අකුශල කර්‍මය මේ ගාථාවලින් කීහු.

කිසිවකු විසින් නොනවත්වන ලද නදීතඩාගාදී මිනිසුන් ජලස්නානාදිය කරන තොටුපොළවල මිනිසුන් තබා අමතකව ගිය යම් කිසිවක් ලබන්නමු නම් මැනවැයි සිතා ලෝභයෙන් මැඩුණු සිත් ඇතිව අඩමසක් පමණ කල් ආහාර සොයා අවිද්දෙමු. නොහොත් එළඹී කිසිවකු විසින් නොවළක්වන ලද සත්වයන්ගේ ශ්‍රමණ බ්‍රාහ්මණයන් විද්‍යාමාන කල්හි මසුරු මලයෙන් මැඩුණු සිත් ඇතිව අඩමස්සක් පමණකුදු කිසිවකුට නොදෙමින් විශේෂයෙන් වස්තුව රැස් කළෙමු. දියයුතු දාන වස්තුව ඇති කල්හි තමාට පරලොවදී පිහිට වන පිනක් අපි නොකෙළෙමු. පැන් පවසින් පෙළෙන ලදුව ගඟක් ළඟට පැමිණියෙමු නම් කවුඩන් විසින් ඉවුරේ සිට පියයුතු තරමට පිරී ගලා බසින ගඟ අපගේ පාපකර්‍ම හේතුවෙන් දිය හිස් වී වැලි පමණක්ම වෙයි.

ප්‍රයොගාශය ශුධියට හේතු භාවයෙන් තීර්ත්ථ නම් වු උෂ්ණ කාලයෙහි සෙවණ ඇති තැනකට පැමිණියෙමු නම් එතනට අව්ව වැටෙයි. සිහිල් වාතය ඇඟ වැදීමෙන් ගිනි හා සමානව අපගේ ශරීර දවමින් හමයි. ස්වාමීනී යට කියන ලද ඒ පිපාසාදී දුක් හා ඊටත් වඩා ලාමක වු දරුණු වු වෙනත් දුක් විඳීමට අපි සුදුස්සෝ වෙමු.

නින්දිත පව්කම් කළ හෙයිනි. බොහෝ කල් බඩගින්නේ පීඩිතව ආහාරයෙහි ගිජුව නොයෙක් යොදුන් ගණන් දුර ගොසිනුත් කිසි ආහාරයක් නොලබාම නවතිමු. අනේ අපගේ පින් නැති කමක හැටි, සාදුක් ඇති අපි ක්ෂුධා පිපාසාදී දුකින් හටගත් ක්ලාන්තව ඇතිව කරකැවී ප්‍රපාතයක වැටුණාක් මෙන් බිම ඇද වැටෙන්නෝ වෙමු. සමහර විට උඩුකුරුව වැටී කැඩී ගිය අත්පා ආදී අවයව ඇත්තවුන් සේ සිටිමු. සමහර කලෙක මුණින් වැටෙමු. එම පොළොවේ මුණින් වැටුණ ඒ අපි නැගී සිටිය නොහැකිව වෙවුලමින් මහත් දුකට පැමිණ තමන් පපුව හා හිසත් ගටා ගනිමු. අපගේ පින් නැතිකම අඳෝමයි. ස්වාමීනී මෙකී දුක් රැස විඳීමට හා ඊට වඩා දරුණු වු ලාමක වු තවත් දුක් විඳීමටත් අපි සුදුසුස්සෝ වෙමු. මක්නිසාද යත් දාන වස්තුව තිබියදී තමාට පරලොවදී පිහිට වන පිනක් අපි නොකළෙමු එහෙයිනි. ස්වාමීනී ඒ අපි මේ ප්‍රේත අපායෙන් මිදීගොස් මනුෂ්‍යාත්මය ලබා දන් දෙනසුලුව නොහොත් යාචකයන්ගේ වචන දන්නාසුලුව ශීලයෙන් යුක්තව බොහෝ කුසල් කරන්නෙමු යයි කීවෝය.

තෙරුන් වහන්සේ එපවත් භාග්‍යවතුන් වහන්සේට සැල කළෝය. භග්‍යවත් බුදු රජාණන් වහන්සේ ඒ කරුණ අර්ත්ථොත්පත්ති කොට ගෙන සම්ප්‍රාප්ත පිරිසට දහම් දෙසු සේක. ඒ ධර්මය අසා මහජන තෙමේ මසුරුමල පහකොට දානාදී කුශල ක්‍රියා කරමින් සුචරිතයෙහි යෙදුනේ විය.

# අපි නිර්මාංශී වෙමු.


**මෙත් සවිය සාමාජිකයින්ගේ නිවෙස් වලට සෝයා කිරි සැපයීමේ වැඩ සටහන හා රට තුළ ප්‍රෝටීන් බහුල සෝයා කිරි ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය**


ශ්‍රී ලංකාවේ වගා කෙරෙන සෝයා බෝංචි වලින් ප්‍රෝටීන් සපිරි කිරි ආශ්‍රිත නිෂ්පාදන සඳහා වෙළඳ පොළක් සකසා කිරි පිටි සඳහා අධික විදේශ විනිමයක් ඇදී යාම වැළැක්වීම සඳහා කිරි පිටි වෙනුවට පෝෂ්‍ය ගුණයෙන් සපිරි ගුණාත්මක සෝයා කිරි පරිභෝජනය සඳහා ජනතාව උනන්දු කරවීමේ අරමුණින් සෝයා කිරි භාවිතය ප්‍රචලිත කිරීමේ ජාතික වැඩ පිළිවෙළක් මෙමගින් ක්‍රියාත්මක කිරීමට අදහස් කෙරේ. තවද ඉහළ යන පොල් මිළද ඒ මත ජනතාවගේ එදිනෙදා ආහාර පිස ගැනීමේ අධික ජිවන බරට උරදීමක් වශයෙන් පොල් කිරි වෙනුවට සෝයා කිරි භාවිතයට යොමු කරවීමක්ද මෙම ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කිරීමට අදහස් කෙරේ.

**ගුණාංග**

හෘද රෝගීන්□ දියවැඩියාව රෝගීන් සඳහාද ඉතා ගුණාත්මක ආහාරයක් වන අතර සෝයා ප්‍රෝටීන් 40%ක්ද, මේදය 20%ක්ද,කාබෝහයිඩේට් 37%ක්ද,විටමින් හා ඛනිජ 6%ක්ද අන්තර්ගත වේ. සෝයා කිරි කොලස්ටරොල් රහිත වන අතර ලෙසතීන්ද අන්තර්ගතයි එමගින් ලේ නහර වල ඇති කොලෙස්ටරොල් අඩු කිරීමටද සමත් වේ සෝයා වල ,විටමින් බී, අන්තර් ගත වේ. ඉතා ඉහළ ගුණාත්මක වටිනාමක් ඇති සෝයා මාංශජනක ප්‍රෝටීනයක් නොව එළවළු/ ශාක ප්‍රෝටීනයක්ද වේ. සත්ව ඝාතනය අවම කිරීම පිණිස නිර්මාංශ ආහාර ප්‍රචලිත කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.

**මැතිවරණ කොට්ඨාශ මට්ටමින් සෑම නගරයකම සුළු පරිමාන ව්‍යාපාරිකයින් විශාල පිරිසක් බිහි කිරීම.**





**පාසැල් සිසුන් හා දහම් පාසැල් සිසුන් සඳහා කිරි වීදුරුවක් සැපයීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමට දායක වීම.එමගින් නීරෝගී පරපුරක් බිහි කිරීම.**

**පොල් හිඟයට විසඳුමක් කිරි පිටි වෙනුවට ආදේශයක් මස්,මාංශ වෙනුවට ප්‍රෝටීන් බහුල Soya Bean Curd (Tofu) නිෂ්පාදන මගින් ශරීරයට අවශ්‍ය ප්‍රෝටීන් ලබා දීමට ඇති හැකියාව**

**ප්‍රෝටීන් බහුල සෝයා ආහාර පාරභෝජනයෙන් මන්ද පෝෂණය දුරු කිරීමටද රුකුලක් වනු ඇත.**

නව ව්‍යාපාරකයින් රැසක් බිහි කිරීමට හැකියාවැති ආදර්ශ අලෙවි සැලක් ආරම්භ කර එමගින් මෙම ජාතික වැඩ පිළිවෙළ පිළිබඳ ජනතාව දැනුවත් කර ණීනිර්මාංශාහාර අලෙවි සැල්□ සෑම නගරයක් පුරාම ආරම්භ කිරීමේ අඩිතාලම සඳහා මුල පිරීයහැකි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙහිලා ඔබ සැමගේ සහය පතමු.

යෝජිත ණීනිර්මාංශ අලෙවිසැල් ණීව්‍යාපෘතිය පළමු අදියරේදී කොළඹ දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි ප්‍රධාන නගර මුල් කරගෙන ඒ සඳහා යෝග්‍ය ස්ථාන තෝරා ආරම්භ කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ හැක. එමගින් දේශිය නිර්මාංශ ආහාර අලෙවිසැල් සංකල්පයක් බිහි කොට දේශියවුත්,ජාතිකවුත් ආගමික රාමුවක් තුළ මෙම ව්‍යාපෘතිය බිහි කිරීමෙන් අප ඉලක්ක කරා පිය නැගිය හැකි යනු අප විශ්වාසයයි.

එබැවින් මේ සඳහා ඔබ සැමගේ අදහස් හා යෝජනාද එලෙසම මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙහිලා අවශ්‍ය දායකත්වය ලබා දෙන්නේ නම් අගයමු.

මේ සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහනට සහභාගී වීමට කැමති අය වෙතොත් මෙත් සවිය කාර්යාලයට දන්වන්න. නැතහොත්

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**එම්. විජේසිරි මයා,**
**138, කවුඩාන පාර, දෙහිවල**
**(071-2304808) විමසන්න.**

## මෙත් සවිය කාන්තා කමිටුව යළි පිහිටුවන ලදි

මෙත්සවිය සාමාජිකා නන්දනී වික්‍රමසූරිය මහත්මියගේ මූලිකත්වයෙන් බොහෝ සාමාජිකාවන්ගේ සහයෝගය සහිතව 2010 08 29 දින අපට මහත් අවශ්‍යතාවක්ව පැවති කාන්තා කමිටුව වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයේදී රැස්වී නැවත අරඹන ලදි.

කාන්තාවන්ටම අදාළවූ දුක් ගැනවිලි වලදී විවිධ අයුරින් (විශේෂයෙන්ම සාමාජිකාවන්ට හා ඔවුන්ගේ පවුල් වල අයට උදවු කිරිම, අඩු ආදායම් ලාභීන්ගේ දරුවන්ට ශිෂ්‍යත්ව ලබාදීම, ලෙඩ රෝග වලට පිහිට හා තනිවූ අසරණවූ අයට පිහිට ලබා දීම මෙම කමිටුව විසින් කෙරෙන කටයුතු කිහිපයකි.

දානශීල භාවනා වැඩසටහන් වලදී සහයෝගය / ගිලන්පස සැපයීමද සිදුකරනු ඇත. මාසික රැස්වීම සෑම මසකම පළමු ඉරුදින ප.ව. 4.30-5.00 දක්වා කොළඹ 07 ධම්මගවේෂී බෞද්ධාශ්‍රමයේදී පැවත්වේ. අන් අයට පිහිට වීමට කැමති සියළු සාමාජිකාවන්ට හැකිනම් සහභාගීවන ලෙස මෙත්සවිය සභාපතිතුමා මෙත්සිත් පෙරදැරිව ඉල්ලාසිටී.

## සසර චක්‍රය

ඒ කෙසේ වුවද
මගේ ජිවිතයේ ඇරඹුම, ඔබ සමඟයි.
සැමදා ආදරය මා ඔබටමය
ඔබ වගේම
දන්නවාද ?
ජීවිතය පසුව මරණය නැවතත්...
ජීවිතය පසුව මරණය නැවතත්....
මේ ජිවිතය චක්‍රයකි, නිමක් නැති
කවුරුද දන්නෙ ඇරඹුම කොතනක වග
ඉඳුරාම..........නොදනී කොහේද සමුදය
පළමු මුණ ගැසමු කොහේද.....?
නමුදු **මගේ අම්මා**
නුඹය මගේ රුවෙහි ඇරඹුම
සැමදා..........ආදරය ඔබටමය..........
ඔබ වගේම......
කෙසේ වුවද....
මගේ ජිවිතයේ ඇරඹුම ඔබ සමඟයි.
.....................................
..............................
......................

**සී වින්දන හේවගේ**
**මෙත්සවිය සාමාජික 18-3057**

## වකුගඩුවක් අවශ්‍යව ඇත

අංක 301/7, දික්වෙල පාර සියඹලාපේ පදිංචි ආර්. ඒ.දේවප්‍රිය රූපසිංහ මහතාට බද්ධ කිරීමට

**"ඕ" පොසිටිව් /"බී" පොසිටිව් හෝ "බී" නෙගටිව් වර්ගයේ වකුගඩුවක්**

ඉතා ඉක්මනින් අවශ්‍යවී තිබේ.
වයස 46 වන ඔහු දෙදරු පියෙකි.
බද්ධ කිරීමට වකුගඩුවක් පරිත්‍යාග කරන ලෙස කාරුණිකව ආයාචනය කරයි.

**වැඩි විස්තර සඳහා**
**0112976817**
**075-7468672**

## වකුගඩුවක් අවශ්‍යව ඇත

අංක54, පාදිලියාතුඩුව, කිරිබත්ගොඩ, කැලණියේ පදිංචි ප්‍රියන්තී රූපිකා සෙනෙවිරත්න මහත්මිය හට බද්ධකිරීමට

**"ඕ" පොසිටිව් වර්ගයේ වකුගඩුවක්**

ඉතා ඉක්මනින් අවශ්‍යවී තිබේ.
වයස 42 වන ඇයට බද්ධ කිරීමට වකුගඩුවක් පරිත්‍යා කරණ ලෙස කාරුණිකව ආයාචනය කරයි.

**වැඩි විස්තර සඳහා**
**0112948537 / 0776012963**

## නිවේදන සහ නොමිලයේ පලකරනු ලබන සාමාජිකයින්ගේ දැන්වීම්

*වැදගත්*

❖ මෙත් සවිය පුවත් සඟරාවේ පළ කිරීම සඳහා එවන සියලූ ලිපිද, දාන-ශීල-භාවනා වැඩසටහන් වලදී දායකත්වය දරන පිංවතුන්ද, අනෙකුත් පුණ්‍ය කටයුතු වලට අත හිත දෙන පිංවතුන්ද සඟරාවේ ප්‍රකාශනයට පත් කළ යුතු විස්තර ප්‍රමාණයේ කොළවල පමණක් ලියා භාරදිය යුතුය. සාමාජිකයින්ගේ දැන්වීම් නොමිළයේ පළ කරනු ලැබේ. කොළ කැබැලි හා තුන්ඩුවල ලියා එවන විස්තර අස්ථානගත විය හැකි බැවින් ඒ පිළිබඳ වග කියනු නොලැබේ.

❖ සාමාජික සාමාජිකාවන් විසින් එවන සෑම ලිපියකම හා ලිපිය එවන කවරයේද වම්පස උඩ කෙළවරෙහි තම සාමාජික අංකය පැහැදිලිව ලියා තිබිය යුතුය. ඔබගේ ලිපිනය ලියාදීම සඳහා භාවනා වැඩ සටහන් වලදී අප විසින් ලබා දෙන ලිපි කවරවලද අංකය සඳහන් නොකරන හා වැරදි අංක සඳහන් කරන සාමාජිකයින් බොහෝ දෙනෙකු හමු වී ඇති මේ අය සඳහා පුවත් සඟරාව තැපෑලෙන් නොලැබීයාම පිළිබඳව වග කියනු නොලැබේ.

### මෙත් සවිය දුරකතන අංක.....

මෙත්සවිය තොරතුරු විමර්ශනය කරන විට පරිපාලන නිලධාරි මහතා අමතන්න (011-2505088, 0714-014467). එම දුරකතන වල බිල්පත් ගෙවනු ලබන්නේ මෙත් සවිය මෛත්‍රී සංසදය විසිනි. අපගේ වෙබ් අඩවිය වන www.methsawiya.org මගින්ද තොරතුරු ලබා ගත හැකිය.

මීට අමතරව සමලේකම් වරුන් වන තුසිත දොඹගොඩ (071-4454411) හා බී.ඩබ්. චමින්ද (077-7790076) යන මහතුන් ගේ පුද්ගලික දුරකථන අංකයන් අමතාද හදිසි තොරතුරු ලබා ගත හැකිය.

සංසදයේ සභාපති ආචාර්ය චන්දන ජයරත්න මහතා ඇමතීම පුද්ගලික දුරකථන අංක (0714800800) හෝ 0777309385) මගින් දහවල් 12.00-1.00 ත් අතර හෝ රාත්‍රී 9.00-10.00 ත් අතර පමණක් (ඉතා හදිසි අවශ්‍යතාවයකදී ඕනෑම වේලාවක) සිදු කරන්න. (දිනකට දුරකථන පණිවිඩ 30 ක් පමණ ලැබෙන නිසා සාමාජික අංකය හා නම පවසා සංෂිප්ත ලෙස ඔබගේ විමසීම් සිදු කරන්නේ නම් මැනවි.)

### නොමිළයේ රෝද පුටු සහ කිහිලි කරු ලබා දීම.

මෙත් සවිය මගින් අසරණ අය සඳහා රෝද පුටු සහ කිහිලිකරු පරිත්‍යාග කිරීමේ වැඩපිළිවෙළක් දියත් කර ඇත. රෝද පුටු හෝ කිහිලි කරු අවශ්‍ය අය වෙත්නම් මෙත්සවිය වෙත ලිඛිතව ඉල්ලීමක් සිදු කළ යුතුය. මෙම වැඩසටහන සඳහා රෝද පුටු සහ කිහිලි කරු ලබා දී දායක වීමට කැමති පින්වතුන් හට එම උපකරණ මෙත් සවිය වෙත ලැබෙන්නට සලස්වන ලෙස මෙත් සිත් පෙරදැරිව ඉල්ලා සිටිමු.


**වැඩිහිටි දෙමාපියන්ට හා මානසික ආබාධිත අයට නේවාසික පහසුකම්**

අපි වැඩිහිටියන්ට සලකමු

**ඩේවිඩ් ජයසුන්දර වැඩිහිටි නිවාසය**

වැඩිහිටි දෙමාපියන් නේවාසික හා දිවා සුරැකුම් ස්ථානය
අංක 721/ සීල පන්සල පාර, දළුගම, කොහොල්විල, කැළණිය.
දු.අ. 011-2912297, 071-6246101, 060-2162661
E-Mail: jayasundra@sltnet.lk


### කොළඹ ජාතික රෝහලේ වාට්ටු සඳහා බුදු පිළිම සහ අසරණ රෝගීන් සඳහා අවශ්‍ය මූලික ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම

වැල්ලවත්තේ ශ්‍රී විජයාරාමාධිපති අභංගම ආනන්ද ස්වාමීන් වහන්සේගේ අනුශාසනා පරිදි පැවැත්වෙන ඉහත සත්කාර්ය සඳහා බුදු පිළිම, සුදු රෙදි සැත්කම් වලදී අන්දවන ඇඳුම්, දත් බුරුසු හා දන්තාලේපන, තුවා, සුති හෝ පාට සරම්, ඇඳ පෝච්චි ඇතුළු අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාග කිරීමට කැමති පින්වතුන් එම ද්‍රව්‍ය ගරු ස්වාමීන් වහන්සේට හෝ කාර්යාලයට පැමිණ භාර දෙන්න.

**ප්‍රායෝගික අධිමානසික විද්‍යාව හා පංච අභිඥා පිළිබඳව දැනුවත් කිරීමේ**

**18 වන වැඩ සටහන**

2010.12.05 වන දින පෙ.ව. 10.00 ට අරඹනු ලබන අතර ඒ සඳහා අයදුම්පත් 2010.11.28 වන දිනට පෙර භාර දෙන්න.
ඉඩකඩ සීමිත බැවින් පළමුව ලියාපදිංචි වන අය සඳහා මූලිකත්වය ලබා දේ.


**සයිට් ,එන්, ස්ටයිල් ඔප්ටොමෙට්‍රිස්ට්ස්**

***SIGHT-N~STYLE OPTOMETRISTS***

නො: 126 ඩී. හයිලෙවල් පාර, නුගේගොඩ.
(අනුලා විදුහල ඉදිරිපිට)
දුරකථන : 2854758
(සියලුම වර්ගයේ ඇස් කණ්නාඩි අවශ්‍යතා සඳහා විමසන්න)
මෙ.ස. සාමාජික නෙරංජලා කන්නන්ගර මහත්මිය


**සුවසෙත**

**ප්‍රාණ විශ්ව ශක්ති ක්‍රම මගින් සමහර රෝග සඳහා සිත දියුණු කර ගත් අය මගින් රෝග සුවයට උපකාර කිරීමේ නොමිළයේ පැවැත්වෙන වැඩසටහන් ඉරු දින වලදී ශ්‍රී විජයාරාමයේදී ප.ව.12.00 - 2.00 දක්වා පැවැත්වේ. කාර්යාලයෙන් විමසා පැමිණෙන්න.**

# මෙත් සවිය මෛත්‍රී සංසදය සාමාජික අයදුම්පත

(ඡායා පිටපත් භාරගනු ලැබේ. මෙම සියලු තොරතුරු සම්පූර්ණයෙන් රහසිගතව තබා ගනු ලැබේ.)

1. සම්පූර්ණ නම ..........................................................

2. ස්ත්‍රී / පුරුෂ භාවය................ 3. ජාතික හැඳුනුම්පත් අංකය..........................
(ඡායා පිටපතක් අමුණන්න)

4. උපන් දිනය...................... 5. වයස.................. 6. ආගම..........................

7. ස්ථිර ලිපිනය..........................................................
..........................විද්‍යුත් තැපැල(e-mail)...................... දුරකථන අංකය..................

8. දිස්ත්‍රික්කය...................... 9. විවාහක / අවිවාහක බව..........................

10. රැකියාවක් කරන්නේ නම් ඒ පිළිබඳ විස්තර..........................................
..........................................................

11. කාර්යාලීය ලිපිනය හා දුරකථන විස්තර..........................................

12. ලිපි එවිය යුතු ලිපිනය..........................................

13. ලබා ඇති ඉහලම අධ්‍යාපනික සුදුසුකම්
 1..........................................................
 2..........................................................

14. වෙනත් සංගම් ආදියෙහි සාමාජිකත්වය දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර
 1 ..........................................................
 2 ..........................................................
 3 ..........................................................

15. ඔබ කිසියම් ශාරීරික රෝගයකින් (ඇදුම,හෘද රෝග,දියවැඩියාව,රුධිර පීඩනය,අපස්මාරය ) පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර
..........................................................

16. ඔබ කිසියම් මානසික රෝගයක් සඳහා වෛද්‍ය ප්‍රතිකාර / ඖෂධ ලබාගෙන තිබේද? ඔව්/නැත.

17. එවැනි මානසික රෝගයකින් පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර . .
..........................................................

18. ඔබ විසින් සඳහන් කළයුතු වෙනිදි වැදගත්යැයි හඟින වෙනත් විස්තර හෝ යෝජනා /අදහස් තිබේනම් මෙහි සඳහන් කරන්න ..........................................................
..........................................................

මා දන්නා තරමින් ඉහත කරුණු සත්‍ය බවට ප්‍රකාශ කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම සාමාජිකත්වය අවලංගු කිරීමට හේතුවක් වලය මා පිළිගනිමි.

දිනය...................... අයදුම්කරුගේ අත්සන..............................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

සාමාජික අංකය..............................

තේරීම් කමිටුවේ තීරණය

.............................. ..............................
තේරීම් කමිටු සභාපති විධායක ලේකම්

දිනය..................

සැ.යු. මෙම අයදුම් පත සමගම ඔබ වෙනුවෙන් පවත්වන විවිධ දේශනා/වැඩමුළු/භාවනා දීක්ෂා කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, දේශනා ශාලා ගාස්තු, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ගාස්තු, පුවත් පත් දැන්වීම්, මුද්‍රිත සටහන් සැපයීම, හැඳුනුම්පත් සැපයීම, තැපැල් ගාස්තු, විදුලි ගාස්තු,කාර්යාලීය ගාස්තු හා පරිපාලන නිලධාරී මහතා වෙනුවෙන් කරනු ලබන මාසික ගෙවීම් ආදිය සඳහා යන වියදම පියවා ගැනීම සඳහා රු.1500/-ක මුදල සාමාජිකත්වය පිරිනැමීමට පසුව එවිය යුතුය.(එය ඇතුළත්වීමේ ගාස්තුව රු.500/-කා වසර පදනම සාමාජික ගාස්තු රු. 500/-x2 වශයෙනි) මෙම බරපැන ගෙවීමට නොහැකි ඉතා අඩු ආදායම් ලබන පවුල්වල අය තම ආදායම් සනාථ කළ හැකි ලිපි ලේඛන සහිත ග්‍රාම නිලධාරීතුමා මගින් විධායක කමිටුව වෙත සාමාජික ගාස්තු ඉවත් කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු ඇත. සාමාජික ගාස්තු ගෙවීම, ඔබ තෝරාගත්තාව පසුව කාර්යාලයට පැමිණ සිදු කළ යුතුය. (දිනය පසුව දැනුම් දෙනු ලැබේ.) කාර්යාලය සඳුදා, අඟහරුවාදා හැර සතියේ ඉතිරි දින 5 තුල සෙනසුරාද, ඉරිදා ද ඇතුළුව සතියේ දින 5ක විවෘතව පවතී. අයදුම් කරන සෑමදෙනාම තෝරා නොගන්නා අතර එසේ තෝරා නොගැනීමට හේතුව දැනගැනීමට අවශ්‍ය නම් අයදුම්පත විමර්ශනය සඳහා වන ඇතුළත්වීමේ ගාස්තු ගෙවිය යුතු වන්නේය.

***නිසිපරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත ජාතික හැඳුනුම්පතේ ඡායාපිටපතක් සහ 4"×9" ප්‍රමාණයෙන් යුතුව ලිපිනය සහිත මුද්දරගෑව 2 ක් සහිත පහත සඳහන් ලිපිනයට තැපැල් මගින් යොමු කරන්න.***

***(අයදුම්පත සමඟ කිසිදු මුදලක් හෝ චෙක් පතක් නොඑවන ලෙස කරුණාවෙන් දැනුම්දෙනු ලැබේ)***

***ලිපිනය-කරු ලේකම්, මෙත්සවිය, ශ්‍රී විජයාරාම, පෙම්රිකා පාර, කොළඹ 6. දුරකථනය 0714-014467***

# පිං පොතෙන් බිඳක්...!





මෙත් සවිය උප සභාපති සරත් ඉලංගෝන් මහතා සහ එම මැතිණියගේ ධන පරිත්‍යාගයෙන්
මෙත් සවිය හරහා පිළිකා රෝහලේ ළමා වාට්ටුවට ජීවානුහරණ යන්ත්‍රය ඇතුළු ද්‍රව්‍ය පරිත්‍යාගය






මෙත් සවිය සාමාජිකා ශ්‍යාමා මහත්මියගේ මූලිකත්වයෙන් සංවිධානය කල
පිළිකා රෝහලේ 15 සී ළමා වාට්ටුවට බෙහෙත් ද්‍රව්‍ය පරිත්‍යාගය



සත්ව හිංසනය වැලැක්වීමේ ප්‍රායෝගික මඟක ගමන් ගන්නා මෙත් සවිය මගින් රු. ලක්ෂ 04 ක් පමණ වටිනා අති පූජ්‍ය අහංගම හිමියන් විසින් ගව ඝාතකාගාර වලින් නිදහස් කර ගත් ගවයින් 10 ක් පළමු අදියර ලෙස ආදි වාසීන් කීපදෙනෙකුට භාර දීම






ආදි වාසී වන්නිල ඇත්තන්ගේ භාර්යාවගේ වකුගඩු රෝගයට බෙහෙත් ගැනීමට දඹානේ සිට නුවරට පැමිණීමට මුදල් අවශ්‍ය නිසා රු. 34000 ක් මෙත් සවිය 19 කණ්ඩායම ධන පරිත්‍යාගයෙන් ලබා දීම

# 2010.02.07 ධර්ම ගවේශී බෞද්ධාශ්‍රමයේ පැවති මෙත් සවිය පස්වන සමුළුව සහ මෛත්‍රී භූෂණ උපහාර ප්‍රධානෝත්සවයේ විශේෂ අවස්ථා



පූජ්‍ය වැලිගම ශ්‍රී ඤාණරතන මාහිමියන්ගේ වැඩමවීම



පූජ්‍ය හාරිස්පත්තුවේ ආරියවංශාලංකාර හිමිගේ වැඩමවීම



පූජ්‍ය අහංගම ආනන්ද මෛත්‍රී හිමියන්ගේ වැඩමවීම



සම්මාන ලාබීන් පෙරහැරින් වැඩමවීම



උත්සවයට පැමිණි නාහිමිවරුන්



වෛද්‍ය ඇල්බඩ සුනිල් ලියනගේ මැතිතුමා පොල්තෙල් පහන දැල්වීම



උපසභාපතිතුමා පොල්තෙල් පහන දැල්වීම



උත්සවයට පැමිණි නාහිමිවරුන්



ආරාධිතයන්ට පිදෙන සම්මාන



වෛද්‍ය ඇල්බඩ සුනිල් ලියනගේ මැතිඳුනට මෙත් සවියෙන් පිදෙන මෛත්‍රී භූෂණ අහිංසා සාධක සම්මානය පිදීම



උත්සවයට පැමිණි මෙත් සවිය සාමාජික සාමාජිකාවන්ගෙන් බිඳක්...



උත්සවයට පැමිණි මෙත් සවිය සාමාජික සාමාජිකාවන්ගෙන් බිඳක්...

ශ්‍රී විජයාරාමය, ෆෙඩ්‍රිකා පාර, කොළඹ 06
දු.ක.: 0714 014467 දු.ක./ෆැක්ස් : 011 2505088 වෙබ් අඩවිය : www.methsaviya.org විද්‍යුත් තැපෑල : office@methsaviya.org

Suranga @ CR Print Horana 0344 920 735